www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බ්‍රිතාන්‍යය: ඉරාක විමර්ශන ඒකකය සාපරාධී මිනිසුන්ගෙන් සාක්ෂි විමසයි

**Britain: Iraq inquiry hears the testimony of guilty men**

2009 දෙසැම්බර් 04

සර් ජෝන් චිල්කොට්ගේ ප්‍රධානත්වයෙන් යුතු ඉරාක යුද්ධය පිලිබඳ නිල බ්‍රිතාන්‍ය විමර්ශන ඒකකය විසින් ඒකාබද්ධ බුද්ධි අංශ කමිටුවේ හිටපු සභාපතිවරයෙකු වන ශ්‍රීමත් පීටර් රිකට්ස්; 2002 සහ 2004 අතර කාලය තුල ආරක්ෂාව හා බුද්ධි අංශය සඳහා විදෙස් කාර්යාලයේ අධ්‍යක්ෂක ජනරාල් විලියම් අර්මන්; ඉරාක ආක්‍රමනයට වගකිව යුතු ඇමරිකා එක්සත් ජනපදයට එක්සත් රාජධානියේ තානාපති ශ්‍රීමත් ක්‍රිස්ටෝපර් මේයර්; 1998 සිට 2003 දක්වා කාලයේදී එක්සත් ජාතීන්ගේ සංවිධානයට බ්‍රිතාන්‍යයේ අඛන්ඩ නියෝජිත ශ්‍රීමත් ජෙරමි ග්‍රීන්ස්ටොක්; සහ එවක අගමැති ටෝනි බ්ලෙයාර්ගේ ප්‍රධාන විදේශ ප්‍රතිපත්ති උපදේශක ශ්‍රීමත් ඩේවිඩ් මැනිංග් යන අයගෙන් සාක්ෂි කැඳවීය.

ජනාධිපති ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ්ගේ එක්සත් ජනපද පාලන තන්ත්‍රය විසින් නීති විරෝධී ඉරාක යුද ආක්‍රමනය සැලසුම් කිරීමේදීත් යුද්ධය දියත් කිරීමේදීත් බ්ලෙයාර් ආන්ඩුවේ පාපසහයකතාව පිලිබඳ සනාථ කරන සාක්ෂි ඔවුන් සියලු දෙනා ම විසින් සපයා ඇත.

9/11 සිදුවීම ව්‍යාජෝක්තිය වසයෙන් යොදා ගනිමින් ආන්ඩු-මාරු කිරීමට වොෂිංටනයේ නව-කොන්සර්වේටිව්වාදීන්ගේ අභිප්‍රාය වී පැවති බවත් යුද්ධයකට සූදානම් වීමේ අවසන් තීන්දුව ටෙක්සාස්, ක්‍රොව්ෆෝඩ්හිදී 2002 අප්‍රේල් මස බුෂ් හා බ්ලෙයාර් අතර හමුවක දී ගත් බවත් ග්‍රීන්ස්ටොක් හා මේයර් විසින් අනාවරනය කල ප්‍රමුඛ සාක්ෂි අතර වේ.

විවිධ ක්ෂේත්‍රවල ඉහල සිවිල් නිලධාරීන් ඔවුනොවුන් හඳුන්වා දෙනු ලැබූවේ තමන් සහය නොදෙන යුද්ධයකට බලාත්කාරයෙන් තල්ලු කර යවනු ලැබූ, ලේබර් ආන්ඩුවේ අසරන ඉත්තන් වසයෙනි. උදාහරනයක් ලෙස තම සාක්ෂි දීමේ දී ග්‍රීන්ස්ටොක් පැවසුවේ, යුද්ධයට අනුමැතිය පලකරන දෙවැනි යෝජනාවක් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලයේ දී සම්මත නොවූවහොත් 2002 ඔක්තෝබර් මාසයේ දී ඔහුගේ තනතුරෙන් දොට්ට දමන බවට තර්ජනය කර තිබූ බවයි. "2003 ඉරාකයේ මිලිටරි ක්‍රියාදාමයට අපගේ හවුල්කාරීත්වය නෛතිකයැයි මම සැලකුවෙමි, එහෙත් ඒ, එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් බහුතරයක, ඇතම්විට එක්සත් රාජධානියේ මහජනයාගෙන් ඉමහත් බහුතරයකගේ පවා ප්‍රජාතාන්ත්‍රික පිටුබලයක් යුද්ධයට නොලැබීම හේතුවෙන් එහි නීත්‍යනුකූලභාවය පිලිබඳව සැකයකින් යුක්තවය" යි ඔහු චිල්කොට්ට පැවසීය.

මේ නම් ඉතිහාසය නැවත ලිවීමකි. ග්‍රීන්ස්ටොක් යුද්ධයට මුලපිරීමේ ප්‍රමුඛ මොලකරුවෙක් විය. බ්‍රිතාන්‍යයේ සහ ජාත්‍යන්තර වසයෙන් මහජනයාගෙන් බහුතරය යුද්ධයට විරුද්ධත්වය සහ එහි නීති විරෝධී බව යන දෙකරුන පිලිබඳව යහමින් දැනුවත්ව සිටි බ්ලෙයාර්, විදෙස් ප්‍රතිපත්ති උපදේසක ශ්‍රීමත් ඩේවිඩ් මැනිංග් සහ අනෙකුන්ගේ උපදෙස් මත, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ යෝජනාවක ස්වරූපයෙන් නීත්‍යානුකූල වැස්මක් සකසන ලෙස බුෂ්ගෙන් ඉල්ලා සිටියේය. විවිධාකාර පොරොන්දු ගනනාවක් ඉෂ්ට නොකල හෙයින් "බරපතල ප්‍රතිවිපාකයන්" පිලිබඳව ඉරාකයට තර්ජනාංගුලිය එසවූ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලයේ 1441 යෝජනාව 2002 නොවැම්බර් මස කෙටුම්පත් කරන විට, මෙම දේශපාලන වංචාවට ග්‍රීන්ස්ටොක් මුලුමනින් ම සහභාගී වූවේය. ප්‍රථම ගල්ෆ් යුද්ධයෙන් අනතුරුව 1991 අප්‍රේල් මස සම්මත කරන ලද එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලයේ 687වැනි යෝජනාවෙන් නියම කල සටන් විරාම ගිවිසුමේ කරුනු ඉරාකය විසින් උල්ලංඝනය කිරීම පිලිබඳ ජීවමාන දත්තයන් ඇතයි එය ප්‍රකාශ කලේය.

ඉරාකය එක්සත් ජාතීන්ගේ අවි නිරීක්ෂයන්ට එකග වූ බවත් චෝදිත පරමානු ගබඩා වෙත ඔවුන්ට ප්‍රවේශ වීමට අවකාශ ලබා දුන් බවත් 2002 දෙසැම්බර් මස, එක්සත් ජාතීන්ගේ අවි පරීක්ෂක ප්‍රධානී හැන්ස් බ්ලික්ස්, ග්‍රීන්ස්ටොක්ට දැන්වුවේය. "නිරීක්ෂකයන් සමග ඉරාකයේ සියයට සියයක ම ප්‍රතිශතයක සහයෝගය ලැබීමට අවශ්‍ය වනු ඇත" යි කියමින්, ග්‍රීන්ස්ටොක් ඔහුගේ යෝජනාව ගසාබසා දැම්මේය.

ඉරාක ආක්‍රමනයක් සඳහා කොල එලියක් දල්වන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලයේ දෙවන යෝජනාවක් සම්මත කර ගැනීමට එක්සත් ජනපදයට අභිනියෝගයක් නැති බව පැහදිලි වූ විට, 2003 මාර්තු 17 වෙනි දින වොෂිංටනයට හා ලන්ඩනයට ''ඉරාකයේ නිරවිකරනය සහතික කර ගැනීමට තමන්ගේ ම පියවරයන් අනුගමනය කිරීමට අයිතියක් ඇත'' යි සඳහන් කරමින්, යුද්ධය පිලිබඳ ඒකාබද්ධ ප්‍රකාශනයක් කිරීමට එක්සත් ජනපදයට සහ බ්‍රිතාන්‍යයට ඇති අයිතිය ගැන මතක් කර දුන්නේ මේ ග්‍රීන්ස්ටොක් විසින් ම ය.

තම සාක්ෂි දීමේ වාරයේ දී, බ්‍රිතාන්‍ය මහකොමසාරිස් ශ්‍රීමත් ක්‍රිස්ටෝපර් මේයර් අනාවරනය කලේ, නිව් යෝර්ක් හා වොෂිංටනය වෙත ත්‍රස්තවාදී ප්‍රහාරයන් එල්ල වූ 2001 සැප්තම්බර් 11 වෙනි දිනට ඉතා ආසන්නයේ දී ම සදාම් හුසේන් පාලන තන්ත්‍රය ප්‍රහාරයන්ට සම්බන්ධව තිබිය හැකියයි එක්සත් ජනපද රාජ්‍ය ආරක්ෂක උපදේසක කොන්ඩොලීසා රයිස් විසින් තමාට ප්‍රකාශ කල බවයි.

2002 මාර්තු 18 වෙනි දින, මේයර්, බුෂ් පාලනාධිකාරියේ යුද්ධයට ප්‍රධාන අද්වකාත් කෙනෙකු වන පෝල් වුල්ෆොවිට්ස් සමග තම හමුව පිලිබඳ යලි ආවර්ජනය කරමින් ඩේවිඩ් මැනිංග්ට ලිව්වේය. ''ඉරාකය සම්බන්ධයෙන් මා වැඩ පටන් ගත්තේ පසුගිය සතියේ ඔබ ඉදිරිපත් කල කොන්ඩි රයිස්ගේ ලේඛනයට අතිශයින් අනුකූලවයි. පාලන වෙනසකට අප පිටුබලය සැපයුවෙමු, එහෙත් සැලස්ම සාර්ථක විය යුතුව තිබූ අතර අසමත්වීම විසඳුමක් නොවිය යුතු විය'' මේයර් කීවේය. ''මා එතැන් සිට ක්‍රියාත්මක වූයේ අවි පරීක්ෂකයින් ගැන සදාම් හුසේන් වැරැදි තීරනයක් ගනු ඇත යන්න මත'' යැයි ඔහු තවදුරටත් පැවසීය.

''අවශ්‍ය වුවහොත් යුද්ධය මගින් හෝ සදාම් හුසේන්ට ප්‍රතිචාර දැක්විය යුතුය යන මතයෙහිලා මම දැඩි ආධාර කරුවෙක් වීමි'' යි මේයර් 2005 වසරේ ඩීසී රහස් නමින් එලි දැක්වූ තම මතක සටහන්වලට ලිව්වේය.

2003 ජූනි මස ඩේවිඩ් උස්බෝන්ගේ සම්මුඛ සාකච්ඡාවක් ඇසුරින්, යැස්මින් අලිබ්භායි-බ්‍රවුන් ඉන්ඩිපෙන්ඩන්ට් පුවත්පතට ලියමින්, ''සමූල ඝාතක අවි (ඩබ්ලිව්.එම්. ඩී) තැනින් තැනට මාරු කරමින්, පෞද්ගලික නිවාසවල සඟවා සහ වල දමා ඇති බව සහතික වී ඇතයි ග්‍රීන්ස්ටොක් විසින් තවමත් ස්ථිර ලෙස කියා සිටි'' බව අනාවරනය කලේය.''දැන් මහේශාක්‍ය වීරත්වයකින් තමන්ම ප්‍රදර්ශනය කරන ශ්‍රීමත් ක්‍රිස්ටොර් යහපත් පුද්ගලයෙකු නොවීය'' යැයි ඔහු ඊට එකතු කලේය.

මේයර්ට අනුව, බ්ලෙයාර්ගේ දරුනුතම අපරාධය වන්නේ, මිලියනයකට වඩා අධික ඉරාක වැසියන්ගේ ජීවිත බිලිගත් හා රට සුන්නද් ධූලි කල නීති විරෝධී යුද්ධයක් දියත් කිරීම නොව, එසේ කිරීම වෙනුවෙන් ඇමරිකා එක්සත් ජනපදයෙන් අත්‍යවශ්‍ය දේශපාලන ගාස්තුව අයකර ගැනීමට ඔහු අසමත් වීමයි. ''මාගරට් තැචර් (හිටපු අගමැතිනිය) සිටියානම් කුමක් කරනු ඇත්දැයි මම සිතුවෙමි''යි විමර්ශනයට ඔහු කීවේ ය. ''මම නිකමට වගේ ඇගේ නම සඳහන් කලේ- ඇතම් විට මට අකුනු සැරයක් වැදුනා විය හැකියි - ඒත් මා සිතන්නේ ඇය පැහැදිලි, ඒකමිතික රාජ්‍යතාන්ත්‍රික මූලෝපායකින් යුතුව කටයුතු කරනු ඇති අතර, සදාම් ඉවත් කල විට හා සදාම් ඉවත් කලහොත් එය සිදුවූයේ ඇයිදැයි යන්න පිලිබඳ ඉමහත් ම පැහැදිලි කිරීම ඇය විසින් ඉල්ලා සිටිනු ඇති බවයි.''

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයේ මූලෝපායාත්මක අවශ්‍යතාවන්වලට අවාසිවන ආකාරයෙන් ක්‍රියා කිරීම පිලිබඳව මේයර් බ්ලෙයාර්ට නැවත නැවත දෝෂාරෝපනය කරයි. එහෙත් දැන් තහවුරු වී ඇති පරිදි ඔහු සහ අනෙක් නිලධාරීන් යුද්ධයට සහය පල කර ඇත්තේ එය බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයේ මූලෝපායාත්මක අවශ්‍යතාවන් මත ගෙන යන්නක්යැයි ඔවුන් විස්වාස කල හෙයිනි. ජාත්‍යන්තරවත් ජර්මනිය හා ප්‍රන්සයේ ආර්ථික සහ දේශපාලනික අවශ්‍යතාවන් මගින් අධිකාරිය දරන යුරෝපයකත් බ්‍රිතාන්‍ය අවශ්‍යතාවන් ක්‍රියාවට දැමීමට සැලසුම් කිරීම සහ ඕනෑම වියදමකින් එක්සත් ජනපදය සමඟ සන්ධානයක් පවත්වා ගැනීම කෙරෙහි වන බ්ලෙයාර්ගේ ප්‍රතිපත්තිය තැචර්ගේ මූලෝපායේ අඛන්ඩ දිගුවක් විය.

චිල්කොට් විමර්ශන ඒකකය වෙත හිටපු නිලධාරීන්ගේ ස්වයං-සාක්ෂ වැමෑරීම වනාහි ඊලග වසරේ මහමැතිවරනයට පූර්ව කාලය තුලදී ලේබර් ආන්ඩුවට එරෙහිව දේශපාලන ප්‍රහාරයන් එල්ල

කිරීමේත් ඉරාකයේ අන්ත පරාජයෙන් තමන්ගේ පූර්ව ක්‍රියාකාරකම් වෙන්කර හුවා දැක්වීමේ පරිශ්‍රමයකත් කොටසකි. ඔවුන් මේ සා දුරකට තම වැරැදි පිලිගැනීමේ රහස ඇත්තේ, නෛතිකව ක්‍රියාකිරීමට බලයක් නොමැති, චෝදනා ඉදිරිපත් කිරීමට නොව ''පාඩම් ඉගැන්වීමට'' පමනක් වගකියන චිල්කොට් විමර්ශනයේ තුනී දඬුවම් පැමිනවීමට සැලකිය යුතු ප්‍රමානයකින් ස්තුතිවන්ත වෙමිනි යන කරුනෙහිය.

එසේ වතුදු ඔවුන් ඔට්ටු වෙමින් සිටින්නේ ගින්නත් සමඟය. අගමැති ගෝඩ්න් බ්‍රවුන් විසින් චිල්කොට් විමර්ශනය කැඳවූයේ හානි-පූරක වැයමක කොටසක් වශයෙනි. එහෙත් ඇතැම් අලාභ දැරිය නොහැකි තරම් විශාලය. බ්‍රිතාන්‍ය පාලක කවයන් තුල ගැඹුරු භේද භින්නවීම - බ්ලේයාර්ට සිය තනතුර අත්හැරීමට බල කෙරුනු හා යුද අපරාධයන් සඳහා ඔහු ගෙනයාමට තවමත් මෙහය වෙමින් පවතින - ඉස්මත්තට පැමිනියේ ඉරාක යුද්ධයේ දුර්-විපාකය තුලින් ය.

සංස්ථාපිතයේ ජ්‍යෙෂ්ට පුරවැසියන් විසින් විවෘතව ම එවැනි ඉල්ලීම් ඉස්මත්තට ගෙන එමින් තිබේ. නිර්පාර්ශවික මංත්‍රී මන්ඩල සාමිවරයෙකු සහ හිටපු නීති අධිපති ජොහාන් ස්ටෙයින් පසුගිය සතියේ *ෆයිනෑන්සියල් ටයිම්ස්* පුවත්පතට ලියමින්, ඉරාක යුද්ධය ''සුවස් සම්බන්ධතාවල දී එහි ප්‍රතිඵල පිලිබඳ දැක්වූ සන්සුන්භාවය ඉක්මවා ගිය බ්‍රිතාන්‍ය ඉතිහාසයේ දැවන්ත ම විදෙස් ප්‍රතිපත්ති කාබාසිනියා කිරීම්වලින් එකකි'' කියා සිටියේය.

ඔහු තවදුරටත් එකතු කලේ, විමර්ශනය ''යුද්ධයේ නෛතිකභාවය'' පිලිබඳ විමසීමට සහ ''නීති විරෝධී ආක්‍රමනයට අනුමැතිය ලබා දෙන එක්සත් ජාතීන්ගේ දෙවැනි යෝජනාවක් නොතිබුන බව'' ඔප්පු කිරීමේ දිසාවට යොමු වනු ඇත යන්න තම බලාපොරොත්තුව බවයි.

එස්.ඒ.එස් බ්‍රිතාන්‍ය විශේෂ ගුවන් සේවයේ හා බොස්නියාවේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හිටපු අන දෙන නිලධාරියෙකු වූ ජෙනරාල් ශ්‍රීමත් මයිකල් රෝස් විසින් යුද අපරාධයන් සඳහා බ්ලෙයාර්ට චෝදනා ඉදිරිපත් කිරීමටත් අනෙක් අයත් එයට ඇතුලත් වන පරිදි එය පුලුල් කිරීමටත් 2006 වසරේදී පලමුවරට කල ඉල්ලීම නැවත වතාවක් ඉස්මත්තට ගෙන ආවේය. පාලන තන්ත්‍රය-මාරු කිරීම යුද්ධයට යාම සඳහා ප්‍රමුඛ හේතුව වසයෙන් බ්ලෙයාර් ආන්ඩුව පැහදිලිව ගෙනහැර නොපෑ තැන් පටන් ම, බ්ලෙයාර් විසින් පාර්ලිමේන්තුව, සත්‍ය වසයෙන් ම, මුලු රට ම නොමඟ යවා ඇති අයුරු පෙනී යයි'' යැයි ඬේලි මේල් පුවත් පතට ලියමින් හෙතෙම සඳහන් කලේය.

''. . .වගකීම භාරගත යුත්තේ හුදෙක් බ්ලෙයාර් පමනක් නොවේ. යුද්ධයට පූර්ව රංගයේ දී, යුද්ධය යුක්ති සහගත කිරීමේ දී යොදා ගනු ලැබූ බුද්ධි අංශ තොරතුරුවල වලංගුභාවය පිලිබඳ ප්‍රශ්න කිරීමට නිසි ලෙස අසමත් වූ පාර්ලිමේන්තු මංත්‍රීවරුන් ද එයට ඇතුලත් බව පැහදිලිය. . . . යුක්තිය පසිඳලීමට, සහ ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි වන විස්වාසය රට තුල ස්ථාපිත කිරීමට නම්, ටෝනි බ්ලෙයාර් සහ ඉරාක යුද්ධයේ කුරිරු අපරාධයන්ට වගකිව යුතු නිලධාරීන් - යුද අපරාධයන් සඳහා ඔවුන්ට චෝදනා එල්ල කිරීමට මෙහෙයවිය හැකිවන - නීතියේ උසාවියක් හමුවේ පෙනී සිටිය යුතු''යැයි ඔහු තවදුරටත් එකතු කලේය.

යුදඅපරාධ චෝදනා එල්ල කිරීම සඳහා වන ඉල්ලීම අවසන් විය යුත්තේ කොතිනින් ද? ටෝනි බ්ලෙයාර්, එකල විදෙස් ලේකම් හා ආරක්‍ෂක ලේකම් පිලිවෙලින් ජැක් ස්ට්‍රෝව් සහ ජෝෆ් හූන් ද ඇතුලත්ව ඔහුගේ කැබිනට් මන්ඩලයේ ප්‍රධාන පුද්ලයන්ගෙන් ද සාක්ෂි විමසිය යුතුය. එමෙන් ම බුෂ් හා ඔහුගේ ඉහල නායකත්වයන් ඔවුන් සමග විත්ති කුඩුවට නැංවිය යුතුය.

එහෙත් යුද්ධයට යාමට බ්ලෙයාර්ගේ තීරනයට, තම තමන්ගේ පෞද්ගලික මතිමතාන්තර කවරක් වුවත් ලේබර් ආන්ඩුව, විපක්ෂයේ කොන්සර්වේටිව්වාදීන් සහ සිවිල් සේවයේ හා මිලිටරියේ ඉහල ලොක්කන්ගේ කල්ලිය විසින් පිටුබලය සැපයුවෝය. වැරදි බුද්ධි අංශ තොරතුරුවලින් හෝ, බ්ලෙයාර්ගේ ප්‍රසිද්ධ ප්‍රතිසහතික කිරීම්වලින් ඔවුන් මංමුලා වී සිටියා නොවේ. මිලියන ගනනාවක මහජනයා එතරම් දැඩි පරිශ්‍රමකින් තොරව මෙම මුසාවන් විනිවිද සත්‍යය අනාවරනය කර ගෙන සිටිති. එයට ප්‍රතිපක්ෂව, චිල්කොට් හමුවේ සාක්ෂි දීමට කැඳවනු ලැබුවෝ බොරු ප්‍රබන්ධ කිරීමටත් ඒවා ප්‍රචලිත කිරීමටත් පිටුබලය සැපයූහ. ඔවුන් ඉදිරිපත් කල සාක්ෂ සාපරාධී මිනිසුන්ගේ සාක්ෂි වන අතර එයට අනුකූලව ඔවුන්ට ද දඬුවම් පැමිනිවිය යුතුය.

**රොබට් ස්ටීවන්ස්**